# කර්තෘ කාරක වාක්‍ය හා කර්ම කාරක වාක්‍ය (පාඩම 14)

- වාක්‍යයක් යනු සම්පූර්ණ අදහසක් ප්‍රකාශ වන පරිදි පිළිගත් රටාවකට පද කිහිපයක් ගැළපීමයි.
- වාක්‍ය ප්‍රධාන කොටස් 02 ට බෙදේ. → සකර්මක වාක්‍ය
  → අකර්මක වාක්‍ය
- සකර්මක වාක්‍යයක් තුළ ප්‍රධාන අංග 03 කි.

  මම → කර්තෘ/උක්තය
  ගෙදර → කර්මය/අනුක්තය
  යමි. → ආඛ්‍යාතය/අවසාන ක්‍රියාව

- සකර්මක වාක්‍ය ප්‍රධාන කොටස් 02 කි.
  1. කර්තෘකාරක වාක්‍ය
     වාක්‍යයක අවසාන ක්‍රියාවෙන් කර්තෘ උක්ත වන්නේ නම් ඒ කර්තෘකාරක වාක්‍යයයි.
  2. කර්මකාරක වාක්‍ය
     වාක්‍යයක අවසාන ක්‍රියාවෙන් කර්මය උක්ත වන්නේ නම් ඒ කර්ම කාරක වාක්‍යයයි.
     (පාඩම් අංක 09 – 10 ශ්‍රේණිය - වැඩිදුර තොරතුරු)
- මෙම වාක්‍ය සකස් කිරීමේ දී ඔබ හොඳින්ම උක්තය, කර්මය, ආඛ්‍යාතය හඳුනා ගත යුතුය.

1) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය, කර්ම කාරක වාක්‍ය බවට පත් කරන්න.
   I. ගුරුතුමා සටහන් පොත පරීක්ෂා කළේ ය.
   II. හෙදිය ඖෂධ මාත්‍රා රෝගියාට දුන්නා ය.
   III. අපි පොත් කියවමු.
   IV. ගොවියෝ කුඹුරු කොටති.
   V. දන්ත වෛද්‍යවරු මුඛ රෝග පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කළහ.
   VI. නළු නිළියෝ විචිත්‍රවත් රංගනයක යෙදෙමින් ප්‍රේක්ෂකයන් සතුටට පත් කළහ.

(2017 O/L)

2) කර්තෘකාරක වාක්‍ය බවට හරවන්න.
   I. මා විසින් පොත මේසය උඩ තැබෙයි.
   II. ඔවුන් විසින් අපි සුරක්ෂා කරනු ලැබීමු.
   III. දරුවන් විසින් අම්මා සොයන ලද්දීය.
   IV. මිනිසා විසින් ගස් කැපෙයි.
   V. සොරුන් විසින් ආරක්ෂකයෝ පරාජය කරන ලදී.